# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## පුරප්පාඩු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් 2025.10.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### රියදුරු III ශ්‍රේණිය තනතුර (පුරප්පාඩු 03)

**සුදුසුකම් :**

01. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත්වී තිබීම

සහ

මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** U-PL 3(III) රු. 48,005-16,490 - 55,845 p.m. (මාසික)
(මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ)

### නිවාස භාරකරු හා අරක්කැමි III ශ්‍රේණිය තනතුර (පුරප්පාඩු 01)

**සුදුසුකම් :**

01. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වී තිබීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්, ඉහත කාර්යයට අදාළ තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

හෝ

02. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වී තිබීම සහ කාර්මික කුසලතා සහිත අදාළ ක්ෂේත්‍රයක වසරක (01) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** U-PL 2(III) රු. 44,575 - 16 X 490 - 52,415 p.m. (මාසික)
(මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ)

**සැලකිය යුතුයි : පූර්ණකාලීනව රැඳී සිටිය යුතුය.**

### 'වැඩ සහයක III ශ්‍රේණිය තනතුර (පුරප්පාඩු 08)

**සුදුසුකම් :**

01. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත්වී තිබීම.

**වැටුප් පරිමාණය :** U-PL 1(III) - රු. 42,775 - 16 X 450 - 49,975 p.m. (මාසික)
(මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ)

**ඉහත සියලු තනතුරු සඳහා**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. රාජකාරි සඳහා සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයක් තිබිය යුතුය.
III. විශිෂ්ට හා සදාචාරසම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීම්** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

ඉහත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 පරිශ්‍රයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයට බව සළකන්න.

**අයදුම්පත් ක්‍රියාපටිපාටිය :**

i. ඉහත තනතුරු සඳහා ලිපිද්‍රව්‍ය හා විභාග කටයුතු වෙනුවෙන් ආපසු නොගෙවන පදනම මත රු. 500/- ක ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගෙවීම ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 0002323287 ගිණුමට බැර කර රිසිට්පත අමුණා එවිය යුතුය.

ii. අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.ugc.ac.lk වෙතින් බාගත කරගත යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / පිරිස්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07"** යන ලිපිනයට 2025.10.31 ප.ව. 4.00 ට පෙර ලියාපදිංචි තැපැලෙන්යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

iii. අදාළ සහතිකවල පිටපත් සහතික කර, අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

iv. ඉහත වෙබ් අඩවියෙන් බාගත කරන ලද ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරනලද අයදුම්පත් පමණක් සළකා බලනු ලබන අතර, අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම හා අදාළ සහතිකවල පිටපත් අමුණා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

v. රාජ්‍ය සේවයේ හෝ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් එවිය යුතුය.

vi. රියදුරු තනතුරට අයදුම් කරන්නේ නම් වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්ද අමුණා එවිය යුතුය.

vii. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සළකා බලනු නොලැබේ.

viii. ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් වූ අවසානාත්මක තීරණයන් ගැනීම පිළිබඳ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු වේ.

**ලේකම්,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**2025.10.14 වන දින**